Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

ශ්‍රේණිය - 10 | විෂය - කෘෂි හා ආහාර තාක්ෂණය | සතිය - නොවැම්බර් 03 සතිය

01) සාර්ථක බෝග වගාවක් සඳහා පසෙහි සංඝටක මෙන් ම පාංශු ලක්ෂණ කෙරෙහි ද අවධානය යොමු කිරීම ඉතා වැදගත් වේ.

1. (අ) පසෙහි ඛනිජ නොවන සංඝටක දෙකක් නම් කරන්න.

   (ආ) පසෙහි කැටායන හුවමාරු ධාරිතාවය වැඩි කර ගැනීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ගයක් නම් කරන්න.

2. (අ) පසක් ක්ෂාරිය වීමට බලපාන සාධක දෙකක් ලියන්න.

   (ආ) ක්ෂාරීයතාවය නිවැරදි කිරීමට පසට යෙදිය යුතු රසායනික ද්‍රව්‍යයක් නම් කරන්න.

3. (අ) පාංශු ඛාදනයට බලපාන පාංශු ඛාදන කාරක දෙකක් ලියන්න.

   (ආ) පාංශු ඛාදනයේ අහිතකර බලපෑම් දෙකක් ලියන්න.

02) ගෙවත්තක් සැලසුම් සහගතව වගා කිරීමෙන් වාසි රැසක් හිමිවේ.

1. (අ) ගෙවත්තක වගා කළ හැකි ෆැබේසියේ කුලයට අයත් එළවළු බෝග 2ක් ලියන්න.

   (ආ) මෙම කුලයේ ශාකවල දැකිය හැකි විශේෂත්වය කුමක්ද ?

2. (අ) බෝග වර්ධනය කෙරෙහි බලපාන කාලගුණික පරාමිතීන් හතරක් නම් කරන්න.

(ආ) එම කාලගුණික පරාමිතීන් මැනීම සඳහා භාවිතා කරන උපකරණ නම් කරන්න.

3. බෝග වගාවක් නඩත්තු කිරීමේදී සිදු කළ යුතු පශ්චාත් සාත්තු 3ක් ලියන්න.